**උපදෙස් පත්‍රිකා 01**
**(විශ්‍රාම වැටුප්)**

බැංකු සංශෝධන

- **බැංකුවකින් වෙනත් බැංකුවකට විශ්‍රාම වැටුප මාරු කිරීමට නම් ,විශ්‍රාමික මහතා හෝ මහත්මිය විසින් තම ඉල්ලීම අදාළ බැංකුව වෙත ඉදිරිපත් කල යුතුය.**

- **පහත සඳහන් වෙනස්කම් පමණක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සිදු කළ හැකිය.**

i. එකම බැංකුවක, බැංකු ශාඛාව හෝ ගිණුම් අංකය වෙනස් කිරීම
ii. තැපැල් කාර්යාලයක සිට බැංකුවකට විශ්‍රාම වැටුප මාරු කිරීම

**මේ සඳහා බැංකු පොතෙහි තම නම හා ගිණුම් අංකය සඳහන් පිටුවේ ඡායා පිටපතක් සමඟ විශ්‍රාම වැටුප් අයදුම් පත්‍ර 05 ඉදිරිපත් කරන්න.**

iii. ග්‍රාමීය බැංකුවක සිට වාණිජ හෝ ඉතිරි කිරිමේ බැංකුවකට විශ්‍රාම වැටුප මාරු කිරීම
iv. බැංකුවක සිට තැපැල් කාර්යාලයකට විශ්‍රාම වැටුප මාරු කිරීම

**මේ වෙනස්කම් සිදු කිරීම සඳහා පෙර විශ්‍රාම වැටුප් ලැබූ බැංකුව මඟින්, විශ්‍රාම වැටුප එම බැංකුවෙන් ඉවත් කිරීමට එකඟතාවය ප්‍රකාශ කල ලිපියක්, නව බැංකු පොතෙහි තම නම හා ගිණුම් අංකය සඳහන් පිටුවේ ඡායා පිටපතක්(තැපැල් කාර්යාලයකට මෙය අවශ්‍ය නොවේ) සමඟ විශ්‍රාම වැටුප් අයදුම් පත්‍ර 05 ඉදිරිපත් කරන්න.**

v. තැපැල් කාර්යාලයකින් තැපැල් කාර්යාලයකට විශ්‍රාම වැටුප මාරු කිරිම

**මේ වෙනස්කම සිදු කිරීම සඳහා විශ්‍රාම වැටුප් අයදුම් පත්‍ර 05 ඉදිරිපත් කරන්න.**